ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2024 . 11 . 28

පැමිණිලිකාර පාර්ශවය : කේ.එන්.පී.සී.කරුණානායක මයා,
නො.01,
පට්ටියදෙණිය,
නීලගම, කහවත්ත.

වින්දිත පාර්ශවය : කේ.එන්.රොෂාන් චන්දිම කරුණානායක

වගඋත්තරකාර පාර්ශවය :
1. ස්ථානාධිපති,
ප්‍ර.පො.ප, කේ.ඒ.පී.පෙරේරා මහතා,
පොලිස් ස්ථානය,
කහවත්ත.

( සහකාර පොලිස් අධිකාරී,
සබරගමු පලාත් පොලිස් සංචාරක කොට්ඨාශය,
ඌව පලාත්, පොලිස් අධිකාරී කාර්යාලය,
රත්නපුර.)

2. පො.සැ. 45001 ආර්.ජී.විජේසේකර මයා,
පොලිස් ස්ථානය,
කහවත්ත.

( උප පොලිස් පරීක්ෂක - තංගල්ල කොට්ඨාශය)

පැමිණිලි අංකය **: HRC/HO/2288/19**

## පැමිණිල්ල

කේ.එන්.පී.සී.කරුණානායක නැමැති පාසල් ශිෂ්‍යයා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් යොමු කරමින් පවසා සිටින්නේ 2019.07.29 දින සිය වැඩිමල් සහෝදරයා වන කේ.එන්. ඒන්.රොෂාන් චන්දිම කරුණානායක වන වින්දිතයාට වගඋත්තරකාර කහවත්ත පොලිස් ස්ථානාධිපති අතුල කුමාර මහතා සහ පො.සැ.ගාමිණි මහතා විසින් පට්ටියදෙනිය ප්‍රදේශයේදී අමානුෂික ලෙස පහර දුන් බවයි. පහරදීම හේතුවෙන් 2019.07.19 දින පෙ.ව 9.30 පමණ ප්‍රතිකාර ගැනීම සඳහා වින්දිත රොෂාන් කරුණානායකව පැමිණිලිකාරු පාර්ශවය හා ඔහුගේ මිතුරකු වන එම්.පී.රෝහිත කුමාර විසින් ඇතුලත් කිරීමෙන් අනතුරුව එදිනම ප.ව 12.00 පමණ රත්නපුර ශික්ෂණ රෝහලට මාරුකර යැවූ බවත් තවදුරටත් පෙත්සම්කරු ප්‍රකාශ කර සිටී.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිල්ලේ සාක්ෂි

පැමිණිල්ලේ සඳහන් කරුණු තවදුරටත් තහවුරු කිරීම සඳහා සාක්ෂි ලෙස දිවුරුම් ප්‍රකාශ දෙකක් වින්දිත පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලදි.කේ.නුවන් චන්දිම කරුණානායක නැමැති 19 හැවිදිරි පාසල් ශිෂ්‍යයා, කේ.ඒන්.රොෂාන් චන්දිම කරුණායක නැමැති වින්දිතයාගේ බාල සහෝදරයකු වන අතර ඔහු විසින් එක් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර සිටින අතර එම්.පී.රෝහිත කුමාර නැමැති පතල් කර්මාන්තයේ යෙදෙන නීලගම ප්‍රදේශවාසි තරුණයක් විසින් අනෙක් දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර සිටී.

වින්දිත කේ. නුවන් චන්දිම කරුණානායක විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයට අනුව, 2019.07.28 දින නීලගම ප්‍රදේශයේ තරුණයන් පිරිසක් විසින් පැල්මඩුල්ල වත්තේ (Palmadulla estate) මායිමේ කටුමැටි ගසා නිවසක් ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති නීලගම ප්‍රදේශවාසී කේ.එම්. රෝහණ නැමැති අයකුට සාදා දුන් බවත් තම වැඩිමල් සොහොයුරකු වූ කේ.රොෂාන් චන්දිම එම තරුණ පිරිසේ සමාජිකයකු වූ බවත්දක්වා සිටී. 2019.07.28 දින රාත්‍රියේ වත්තේ මුරකරු(තලවර්) හා නිලඇඳුමින් සැරසුනු පොලිස් නිළධාරීන් දෙදෙනෙකු නිවස ඉදිකරනු ලබන පරිශ්‍රයට පැමිණ “ඕක දැන් හදන්න එපා වත්තෙන් අහලා හදන්න” යනුවෙන් පැවැසූ බවත් පසු දින එනම් 2019.07.29 දින උදෑසන පොලිසියට එන ලෙස නව නිවසේ ගෘහමූලික කේ.එම්.රෝහණ යන අයට පැවැසූ බවත් වැඩිදුරටත් කරුණු දක්වයි. 2019.07.29 දින නව නිවසට ගෙවැදීමට කටයුතු සූදානම් කර තිබුන හෙයින් කේ.එන්.රොෂාන් චන්දිම නැමැති තම වැඩිමහල් සහෝදරයා කේ.එන්.නුවන් චන්දිම වන තමා සමඟ එම අවස්ථාවට සහභාගි වූ බව පවසන පැමිණිලිකරු 2019.07.29 දින උදෑසන 8.30 ත් 9.00 ත් අතර තමන් හා වින්දිත රොෂාන් චන්දිම නව නිවස ඉදිරියේ තේ පානය කරමින් සිටිය බවත් එම අවස්ථාවේදී කහවත්ත පොලිසියේ පොලිස් නිලධාරීන් පිරිසක් පොලිස් ජීප් රථයකින් නිවස පිහිටි පරිශ්‍රයට පැමිණි බවත් පවසා සිටියි. එම පිරිස අතර සිටි කහවත්ත පොලිස් ස්නාධිපති වන අතුල කුමාර මහතා හා සිවිල් ඇඳුමින් සැරසුනු පොලිස් සැරයන්වරයකු හා වත්තේ පුංචි මහත්තයා යනුවෙන් හඳුන්වන පුද්ගලයකු තමන් හඳුනාගත් බවත් පවසයි.

පොලිස් ස්ථානාධිපතිතුමා අසභ්‍ය වචනයෙන් බැන වදිමින් උදැල්ලකින් නිවසේ වහලට පහර එල්ල කරන ලද අතර නිවස කඩා දැමීමට ඔවුන්ට පැවසූ බවත් එම අවස්ථාවේ තමන් හා තම සහෝදරයා වන කේ.එන්.රොෂාන් චන්දිම එම ස්ථානයෙන් පිටව යාමට උත්සාහ කල බවත් එම අවස්තාවේදී පොලිස් ස්ථානාධිපතිවරයා විසින් නිවස සෑදීමට ගෙනා උණ පොල්ලකින් කේ.එන්.රොෂාන් චන්දිමගේ හිසේ පිටුපස ප්‍රදේශයට පහරක් එල්ල කල බවත් නැවත නැවතත් නිවස ඉවත් කරන ලෙස කෑගසූ බවත් පවසයි. එම අවස්තාවේදි කේ.එන්.රොෂාන් චන්දිම නිවස අසල සිටුවා තිබූ කණුවක පැටලී ලිස්සා වම් පැත්තට ඇලව වැටුනු බවත්, උණ පොල්ල ඉවත දැමූ ස්ථානාධිපතිවරයා විසින් මාගේ සහෝදරයා වන රොෂාන් චන්දිමට කකුලෙන් පහරදෙමින් පෑගූ බවටත් තවදුරටත් ප්‍රකාශ කර සිටී.

පසුව ස්ථානාධිපතිවරයා නව නිවසේ වහලයේ රඳවා තිබූ ටකරන් ඇද දමමින් නිවස කඩා දමන ලෙස කෑගසූ නමුත් එම අවස්තාවේදී මාගේ සහෝදරයා වන කේ.එන්.රොෂාන් චන්දිම නිවස ගලවා නොදමා නිවස තුළට ගිය බවත්, මෙම අවස්තාවේදී මාගේ සහෝදරයා ස්ථානාධිපතිවරයාගේ නියෝග පරිදි නිවස ගලවා දැමීමට කටයුතු නොකල බැවින් ස්ථානාධිපතිවරයා නිවස තුළට ගොස් ඔහුගේ කමිසයෙන් අල්ලා ගෙන නැවත වතාවක් කම්මුල ප්‍රදේශයට දකුණු අතින් පහරදුන් බවත් පවසයි.එම අවස්තාවේදී එම පහරදීම නැවැත්වීමට ආර්.ඩබ්.ඉන්ද්‍රානි නැමැත්තිය උත්සාහ කල බවත්, ස්ථානාධිපතිවරයා විසින් එම කාන්තාවට තර්ජනය කල බවත් පවසයි.

ඉන්පසු නිවසින් පිටතට පැමිනෙමින් සිටි මාගේ සහෝදරයා වන කේ.එන්.රොෂාන් චන්දිමට මුලදී ස්ථානාධිපතිවරයා පහර දුන් උණ පොල්ලම යොදා ගනිමින් බෙල්ල පිටුපස කොඳුඇටපෙල ප්‍රදේශයට සිවිල් ඇඳුමින් සැරසුනු සැරයන්වරයා විසින් අසභ්‍ය වචනයෙන් තර්ජනය කරමින් පහර එල්ල කල බවත් පැමිණිලිකරු පවසා සිටි. පසුව ස්ථානාධිපතිවරයා විසින් නුදුරින් නවතා තිබූ යතුරු පැදි ඉවත් කර ගන්නා ලෙස අසභ්‍ය වචනයෙන් බැන වැදුනු බැවින් කේ.එන්.නුවන් චන්දිම නැමැති තමන් විසින් තම සහෝදරයා වන කේ.එන්.රොෂාන් චන්දිම නිවස අසල සිටියදී මාර්ගය අසල නවතා තිබූ යතුරුපැදිය රැගෙන ඒමට ගිය බවත් පවසයි.මේ අවස්ථාවේදී රොෂාන් චන්දිම අපහසුතාවයෙන් සිටි බව ඔහුගේ ඇස් රතු වී තිබීමත් හිස පිටුපස අතින් අල්ලාගෙන අපහසුවෙන් ඇවිද ආ බැවින් පැමිණිලිකාර කේ.එන් නුවන් චන්දිම යතුරු පැදියෙන් බැස සහෝදරයා වෙත ගිය විට කේ.එන්.රොෂාන් චන්දිම තම අත මතට සිහසුන්ව වැටුනු බවත් මූනට වතුර ඉස සිහිය ලබා ගැනීමට උත්සාහ දැරූ නමුත් එය ව්‍යාර්ථ වූ හෙයින් අසල සිටි පිරිසගේ උපකාර ලබාගෙන තම සහෝදරයා වන කේ.ඒ.රොෂාන් චන්දිමව ඔසවාගෙන ලසාන් සමින්ද යන අයෙගේ රතු පැහැති XG YZ 9728 දරණ ත්‍රිරෝදරථයෙන් මාගේ සහෝදරයාගේ මිතුරකු වන රෝහිත කුමාර සමඟ කහවත්ත රෝහලට රැගෙන ගිය බව පවසයි. රෝහලට යන අතර මඟ ඔහු සෙම දමමින් වමනය කල බවත් සිහිමද ගතියෙන් පසුවූ බව පවසන පෙත්සම්කරු පසුව කේ.එන් රොෂාන් චන්දිම රත්නපුර රෝහලට මාරු කර යැවූ බවත්, එහිදී දැඩිසත්කාර ඒකකයට මාරු කර යැවූ බවත් ප්‍රකාශ කර සිටී.පසුව එදිනම ප.ව 2.30ට පමණ රත්නපුර නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට මෙම පහරදීම පිලිබඳ පැමිණිලි කිරිමට ගිය බවත් එහිදී නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් පැමිණිල්ල කොළයක ලියා අත්සන යොදන ලෙසත්, රත්නපුර සහකාර පොලිස් අධිකාරීවරයාගේ දුරකථන අංකය ලියූ කොළයක් ලබා දී මා හට එම අංකයෙන් ඇමතුමක් ලැබෙනු ඇති බවට පවසා සිටින ලදි.ඉන්පසු එදිනම සවස රත්නපුර රෝහලට මාගේ සහෝදරයා රොෂාන් චන්දිම බැලීමට ගිය අවස්ථාවේ ඔහුගේ බෙල්ලට කොලරයක් දමා තිබූ බවත් ඔහු කථාකිරීමේ අපහසුතාවයකින් පසුවූ බව තමා දුටු බවත් කේ.එන් නුවන් චන්දිම පවසා සිටී.

2019.07.30 වන දින පෙ.ව 9.30- 10.30 ත් අතර නීලගම ගම්වාසින් විසින් කහවත්ත පොලිස් ස්ථානාධිපති හා සාජන් මහතෙකු මාගේ සහෝදරයාට සිදුකල පහරදීමට විරුද්ධව උද්ඝෝෂණයක් සංවිධානය කල බවත් කේ.එන් නුවන් චන්දිම වන තමාද එයට සහභාගි වූ බවට ප්‍රකාශ කර සිටී.තවද එදින උදෑසන උද්ඝෝෂණය සංවිධානය කරන අතරතුර ඔවුන් විසින් ඉදිකර දුන් නව නිවසේ ගෘහමූලිකයා වන කේ.එම්.රෝහණ හා ඔහුගේ භාර්යාව කහවත්ත පොලිස් නිළධාරින් පැමිණ රැගෙන ගිය බවත් පෙත්සම්කරු ප්‍රකාශ කර සිටී.මෙලෙස පැවැති උද්ඝෝෂණය අතරතුර එම ස්ථානයට පැමිණි රත්නපුර පොලිස් අධිකාරීවරයා විසින් මෙම පහරදීම හෙලා දකිමින් කහවත්ත පොලිස් නිළධාරින්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගන්නා බව පැවසූ බවත් පෙත්සම්කරු පවසයි. එදින එනම් 2019.07.30 වන දින මේ පිලිබඳ සාකච්ඡා කිරීමට ගම්වාසීන්ට සහකාර පොලිස් අධිකාරීවරයා හමුවීමට පැමිණෙන ලෙස පවසා සිටි බැවින්, 2019.07.31 දින පැල්මඩුල්ල පොලීසියේදී නුවන් චන්දිම ඔහුගේ මව ඇතුළු ගම්වාසීන් කිහිපදෙනෙක් සහකාර පොලිස් අධිකාරීවරයා හමුවූ බවත් එම අවස්ථාවේදීම " උසාවි නියෝගයක් නැතිව ගෙවල් කඩන්න බෑ දැකපු කෙනෙක් ඇවිත් කටඋත්තරයක් දෙන්න අපි ඒ පොලිස් නිළධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගන්නවා" යනුවෙන් පවසා ඇත. 2019.07.31 දින රත්නපුර රෝහලේදී පොලිසිය විසින් එකී පහර දීම පිලිබඳ තම සහෝදරයාගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත් බවත් එදිනම දවහල් කාලයේදී සහෝදරයා ප්‍රතිකාර අවසන් කොට රෝහලෙන් මුදවා තිබූ නමුත් ඒ වන විටත් ඔහු අයහපත් සෞඛ්‍ය තත්වයෙන් පසුවූ බව තමා නිරීක්ෂණය කල බව නුවන් චන්දිම තම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර සිටී.

පැමිණිල්ලේ සඳහන් කරුණු තහවුරු කිරීම සඳහා සාක්ෂි ලෙස කේ.ඒන්.රොෂාන් චන්දිම කරුණායක නැමැති වින්දිතයාගේ මිතුරකු වන 27 හැවිරිදි එම්.පී. රෝහිත කුමාර නැමැති පතල් කාර්මිකයා විසින්ද දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර සිටී.

ඒ අනුව 2019.07.28 දින රෝහිත කුමාර නැමැති තමා හා ප්‍රදේශවාසී තරුණ පිරිසක් විසින් පැල්මඩුල්ල වත්තේ මායිමේ කේ.එම්.රෝහණ නැමැත්තාට නිවසක් ඉදිකල බවත් එදින රාත්‍රියේ කහවත්ත පොලිසියෙන් පැමිණ නිවස සෑදීම නතර කරන ලෙසත් කේ.එම්.රෝහණට පසුදින උදෑසන පොලිස් ස්ථානය පැමිණෙන ලෙසත් පැවසූ බවත් ප්‍රකාශ කර සිටී. තවදුරටත් 2019.07.29 දින අළුයම 3.00ට ආසන්න වේලාවකදී නිවස සාදා නිමකල බවත් එදින උදෑසන 8.30- 9.00 අතර චින්දිත රොෂාන් චන්දිම ඇතුළු පිරිස නව නිවස ඉදිරියේ තේ පානය කරමින් සිටියදී කහවත්ත පොලිස් ස්ථානාධිපති අතුල කුමාර මහතාත් සිවිල් ඇඳුමින් සැරසුනු සාජන් මහතෙකු හා වත්තේ පුංචි මහත්තයා වන මනෝජ් යන අය එම ස්ථානයට පැමිණි බවත් ප්‍රකාශ කර සිටී.එම අවස්ථාවේදී කහවත්ත පොලිස් ස්ථානාධිපති තුමා නිවසේ දමා තිබූ ටකරන් වලට ගසමින් නිවස කඩා දමන ලෙස බැන වැදුනු බවත් තමන් වෙනත් මිතුරකුට පොලීසිය පැමිණි බව දැනුම් දීමට දුරකථන ඇමතුමක් ලබාදීම සඳහා නව නිවස පිටුපසට ගිය බවත් එකී දුරකථන සංවාදයේ විනාඩි දෙකක් හෝ තුනක් නිරත වූ බවත් එම්.පී.රෝහිත කුමාර ප්‍රකාශ කර සිටී. දුරකථන සංවාදය අවසන්ව නිවස ඉදිරිපසට පැමිණි තමාට සිවිල් ඇඳුමින් සැරසුනු කහවත්ත පොලිසියේ සාජන් මහතා උණ පොල්ලක් අතේ තබා ගෙන නිවස කඩා දමන ලෙස කෑගසනු දැකිය හැකි වූ බවත්, ස්ථානාධිපතිතුමා නිවස ඇතුළත තිබූ දරුවන්ගේ පොත්පත් ඇතුළු බඩුබාහිරාදී ආදී ඉවතට ඇද දමමින් නිවසේ වහලය කඩාබිඳ දමනු දැකිය හැකි වූ බවත් පවසා සිටී. තවදුරටත් ස්ථානාධිපතිතුමා එම ස්ථානයේ නවතා තිබූ යතුරුපැදි ඉවත් කර ගන්නා ලෙස පැවසූ බවත් අප විසින් යතුරුපැදිය ඉවත් කරගෙන එම ස්ථානයෙන් පිටත්වීමට සැරසුනු අවස්ථාවේදී නුවන් චන්දිම කරුණානායක යන අය ඔහුගේ සහෝදරයා වන රොෂාන් චන්දිම යන අයගේ පිට ප්‍රදේශයෙන් අල්ලාගෙන ඔවුන්ගේ යතුරුපැදිය දෙසට පැමිණෙන අයුරු දුටු බව ප්‍රකාශ කර සිටියි. එම අවස්ථාවේදිම රොෂාන් චන්දිම ඔහුගේ සහෝදරයා වන නුවන් චන්දිමගේ අත උඩ සිහසුන්ව ඇද වැටුනු බවත් තමා ඇතුළු මිතුරු පිරිස විනාඩි පහක් පමණ ඔහු බිම දිගාකර තබා ජලය ඉසමින් ඔහුට කථාකල නමුත් කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ බවත් පවසා සිටී. පසුව ලසාන් චමින්ද වික්‍රමතුංග යන අයගේ රතු පැහැති SG YZ 9728 ත්‍රීරෝද රථයෙන් කහවත්ත රෝහලට ගිය බවත් යන අතරතුරදී රොෂාන් චන්දිම සුදු පැහැයට වමනය කල බවත් පෙ.ව 9.30-10.00 අතර වේලාවකදී කහවත්ත රෝහලේ වාට්ටු අංක 2 ඇතුළත් කල බවත් පසුව ලක්ෂිත නිරෝෂන් යන අය විසින් නුවන් චන්දිමට දුරකථන ඇමතුමක් ලබා දී රොෂාන් චන්දිමව රත්නපුර රෝහලේ දැඩිසත්කාර ඒකකයට ඇතුලත් කල බව දැන්වූ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

<u>වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශය</u>

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොළඹ ප්‍රධාන කාර්යාලයේ අවස්ථාවන් තුනකදී අදාල පාර්ශවයන් කැඳවූ නමුත් ඉන් අවස්ථා දෙකකදී එනම් 2019.11.25 හා 2022.10.07 දින දෙකෙහිදීම වගඋත්තරකරුවන්ගේ සහභාගීත්වයකින් තොරව පැමිණිලි පාර්ශවයේ සහභාගීත්වයෙන් පමණක් පරීක්ෂණය මෙහෙයවා ඇත.2019.11.25 වන දින පැවැත්වූ පරීක්ෂණයෙන් නොපැමිණීම සම්බන්ධයෙන් කහවත්ත පොලිස් ස්ථානාධිපති කේ.ඒ.පී.පෙරේරා මහතා 2019.11.25 දින ෆැක්ස් පණිවිඩයක් මඟින් නොපැමිණීමට හේතුව හදිසි අසනීප තත්වයකට ප්‍රතිකාර ලබා ගැනීම බව දක්වා ඇති නමුත් දෙවන වගඋත්තරකරු වන පො.සැ ආර්.ජී.විජේසේකර 2019.12.02 දින ලිපියක් මඟින් තමා පරීක්ෂණයට නොපැමිණීමට හේතු දක්වමින් කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ විශේෂ පුහුණු පාඨමාලාවකට සහභාගී වීම යන්න දක්වා ඇත.

2019.11.25 දින පැවැති පරීක්ෂණයට චින්දිත කේ.එන් රොෂාන් චන්දිම කරුණානායක සහභාගී වූ අතර එහිදී ඔහු ප්‍රකාශ කර සිටියේ 2019.07.29 දින පෙ.ව 8.30 ට කහවත්ත පොලීසියේ නිළධාරීන් පැමිණ තමන් හා තම මිතුරන් විසින් සාදන ලද නව නිවස කඩා දැමීමට පළමුව යෝජනා කර නමුත්, ඊට විරුද්ධතාවය දැක්වීම හේතුකොට ගෙන තමාගේ ඔළුවේ පිටුපස වම් පසට උණ ලීයකින් පහර

දීමක් සිදු කල බවයි.පහර දීමෙන් පසුව එදිනම එනම්, 2019.07.29 අසළ සිටි අය විසින් කහවත්ත රෝහලට ඇතුළත් කළ බවත් එදිනම රත්නපුර ශික්ෂණ රෝහල වෙත මාරු කර යැවූ බවත් එතැන් සිට 2019.07.31 දින දක්වා A 07 වාට්ටුවට ඇතුළත්ව ප්‍රතිකාර ලැබූ බවත් සඳහන් කර සිටී.රත්නපුර ශික්ෂණ රෝහලේ රෝග විනිශ්ච තුන්ඩුවට අනුව ලේඛන ගත අංක 78385 ලෙස සඳහන්ව ඇතත් අදාල රෝගියා සතුව අධිකරණ වෛද්‍ය පෝරම අංකයක් නොමැති බව පරීක්ෂණයේදී අනාවරණය විය.

නැවතත් 2022.10.07 දින දෙවන වරටත් පරීක්ෂණයක් සිදුකර ඇති අතර මෙම අවස්ථාවේදී වගඋත්තරකරුවන් හේතු දැක්වීමකින් තොරවම පරීක්ෂණයට ඉදිරිපත් වී නොමැති අතර පෙත්සම්කරුගේ පාර්ශවය පමණක් පරීක්ෂණයට ඉදිරිපත්ව ඇත. පහර දෙනු ලැබූ පුද්ගලයින් කහවත්ත පොලිස් ස්ථානයේ ස්ථානාධිපති හා සැරයන් ගාමිණී බව ප්‍රකාශ කර සිටින වින්දිතයා 2019.07.29 වන දින හා ඊට ආසන්න කාලවකවානුව තුල කහවත්ත පොලිසියේ සේවයේ නියුක්තව සිටි මෙම නිළධාරින් දෙදෙනා පරීක්ෂණ පවත්වන අවස්ථාව වන විට වෙනත් පොලිස් ස්ථාන වලට ස්ථාන මාරු ලැබ සේවය කරන බව වැඩිදුරටත් පවසා සිටී.

ඒ අනුව, 2023.02.09 පැවැති පරීක්ෂණයට වගඋත්තරකාර පාර්ශවය පොලිස් මූලස්ථානයේ අධ්‍යක්ෂක පිරිස් හා පාලන මඟින් කරන ලද දැනුම් දීමට අනුව සහභාගි වූ නමුත් වින්දිත පාර්ශවය පරීක්ෂණයට සහභාගි වී නොමැත. වගඋත්තරකාර පාර්ශවය පැමිණ අදාල පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දක්වමින් සඳහන් කරනුයේ, මෙම පෙත්සම්කරුවන් රාජ්‍ය වැව්ලි සමාගම කහවත්තට අයත්වූ ඉඩමක අනවසර ඉදිකිරීමක් 2019.07.28 දින අළුයම්කාලයේදී සිදු කල බවට එම අවස්ථාවේදී දුරකථනය මඟින් පොලිස් ස්ථානය වතු හිමියන් විසින් දැනුවත් කර තිබූ අතර පසු දින පැමිණිල්ලක්ද සිදු කර ඇති බවයි.දුරකථන ඇමතුම ලැබීමෙන් අනතුරුව පො සැ අමරසේකර මහතාගේ ප්‍රමුඛත්වයෙන් අදාළ ස්ථානය පරීක්ෂා කොට ඉදිකිරීම් නතර කරන ලෙසට උපදෙස් ලබා දී තිබූ බවත්ය.පසු දින අදාළ ස්ථානයට ස්ථානාධිපති සහ පොලිස් සැරයන් ගාමිණී පො සැ 42857 එදිරිසිංහ, පොසැරි 23167 තිලකරත්න යන නිළධාරීන් විමර්ශනයට සහභාගි වූ බවත් අදාල නිරීක්ෂණ සටහන් කර නඩු භාණ්ඩ භාරයට ගත් බවත් සැකකරුවකු වශයෙන් කව්පි මුදියන්සලාගේ රෝහණ නැමැත්තා එනම් නව නිවසේ ගෘහමූලිකයා අත්අඩංගුවට ගත් බවත් මේ සම්බන්ධ පැමිණිල්ලක් ගොනු කර නඩු අංක 90569 යටතේ පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් ඇති බවත් වැඩිදුරටත් වගඋත්තරකරුවන් විසින් තොරතුරු පවසා සිටී. පෙත්සම්කරුවන්ට අනුව පොලිස් පහර දීමක් සිදුකර ඇත්දැයි විමසීමේදී, වගඋත්තරකරුවන් පවසා සිටින්නේ එවන් පහරදීමක් සිදු නොවූ බවත් රොෂාන් කරුණානායක නැමැත්තා අත්අඩංගුවට ගැනීමට යාමේදී සෙම පෙරා ගෙන ක්ලාන්ත වී ඇඳ වැටුනු බවත් ඔහුව ත්‍රීරෝද රථයකින් කහවත්ත රෝහල වෙත යැවූ බවත්ය.අනතුරුව ප්‍රධාන සැකකරු වශයෙන් කව්පි මුදියන්සලාගේ රෝහණ නැමැත්තා අත්අඩංගුවට ගැනීමක් සිදුකල බවත් තමා හෝ විමර්ශනයට සහභාගි වූ කිසිම නිළධාරියකුගෙන් මෙම සැකකරුට පහරදීමක් සිදු නොවූ බවත් එවකට පොලිස් ස්ථානාධිපති වශයෙන් කටයුතු කල කේ.ඒ.පී පෙරේරා මහතා සඳහන් කරන ලදි. පෙත්සම්කරුවන්ගේ ප්‍රකාශයන්ට අනුව යමින් 2021.05.07 දින කොමිෂන් සභාව මඟින් අදාල අධිකරණ වෛද්‍ය වාර්ථාව මේ වන විට ලබා ගෙන ඇති බැවින් එකී වාර්තාවේ සඳහන් කරුණු අනුව කේ.එන් රොෂාන් චන්දිමට පහරදීමක් සිදුව ඇති බවත් පහරදීම සම්බන්ධව වෛද්‍ය මතය රෝගියා විසින් දෙනු ලබන රෝග ඉතිහාසය හා සැසඳෙන බවත් වගඋත්තරකරුවන්ට පරීක්ෂණයේදී අනාවරණය කරමින් ඒ සම්බන්ධව ඔවුන්ගේ මතය විමසා සිටින ලදි.

එහිදී එම අධිකරණ වෛද්‍ය වාර්තාව සම්බන්ධයෙන් තමන්ට කිසිවක් කීමට නොමැති බව එවකට පොලිස් ස්ථානාධිපති වශයෙන් කටයුතු කල කේ.ඒ.පී පෙරේරා මහතා පවසයි.

වගඋත්තරකරුවන්ගේ වර්ථමාන රජකාරී තත්වය විමසීමේදී අනාවරණය වූයේ, 1 වගඋත්තරකරු වන කේ.ඒ.පී.පෙරේරා මහතා සහකාර පොලිස් අධිකාරිවරයකු වශයෙන් ඌව පලාත පොලිස්

සංචාරක කොට්ඨාශයට අනියුක්තව, රත්නපුර පොලිස් අධිකාරි කාර්යාලයේ සේවය කරන බවයි. 2 වගඋත්තරකරු පො සැ 45001 මේ වන විට උපපොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම් ලබා 2023 අප්‍රේල් මස සිට තංගල්ල කොට්ඨාශයට ස්ථානමාරුවීම් ලැබීමට නියමිතව ඇති බව තවදුරටත් අනාවරණය විය.

නිරීක්ෂණ

2023.02.29 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, රොෂාන් කරුණානායක නැමැත්තා අත්අඩංගුවට ගැනීමට තැත් කිරීමේදී සෙම පෙරා ගෙන ක්ලාන්ත වී ඇද වැටුනු බවය. මෙකී ප්‍රකාශය අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු මත පදනම්ව ප්‍රශ්න කිරීමේදී තමාට කිසිවක් ප්‍රකාශ කල නොහැකි බව 1 වගඋත්තරකරු පවසා ඇති බව නිරීක්ෂණය වේ.

මෙම ප්‍රකාශය රත්නපුර ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිළධාරි කේ.ඩී.ඩී.වී.ජයතිලක විසින් D 8044/7/19 අනුක්‍රමික අංකය යටතේ නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව හා සැසඳීමේදී නිරීක්ෂණය වන්නේ මොට ආයුධයකින් ඇතිවූ බරපතල නොවන ගණයේ තුවාලයක් ලෙස කේ.එන්.රොෂාන් කරුණානායකට සිදුවූ පහර දීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය මතය දක්වා ඇති බවයි.

හිස්කබල යටින් අස්ථි බිඳීමක් නොමැති බවටද වම් කණට ඉහළින් වම් පැත්තට වන්නට 2cm* 3cm ප්‍රමාණයේ අක්‍රමවත් තැල්මක් නිරීක්ෂණය වන බවට තුවාලයේ ස්වභාවය දක්වමින් අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කොට ඇති බව නිරීක්ෂණය වේ. වින්දිත පාර්ශවයට ඇති වූ පහරදීම ඔහුගේ රෝග ඉතිහාසය හා සැසඳෙන බවට අධිකරණ වෛද්‍යවරයා විසින් තුවාලය සිදුවූ අයුරු දක්වමින් වාර්තාවේ සඳහන් කර ඇත. පෙත්සම්කරු වන කේ.එන් නුවන් චන්දිම කරුණානායක විසින් ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශයන් හා වින්දිතයා විසින් 2019.11.25 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී සිදු කරන ලද ප්‍රකාශ අනුව පහරදීම සිදුකරන ලද ආයුධය වන උණ ලීය අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් "මොට ආයුධයකින් සිදුකල තුවාල " යන්නෙහි ආයුධයෙහි ස්වභාවයට සැසඳෙන බව නිරීක්ෂණය වේ.

නමුත් පැමිණිල්ලේ සාක්ෂි ලෙස ඉදිරිපත් කරන වින්දිතයාගේ මිතුරකු වන එම්.පී.රෝහිත කුමාරගේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු තුලින් මෙම සමස්ථ සිදුවීමෙහි පහරදීමක් සිදුවූ බවත් එකී පහරදීම පොලිස් නිළධාරීන් විසින් සිදුකරන ලද්දක් බවත් තහවුරු නොවේ. එම පහරදීම සිදුවන අවස්ථාවේ එම්.පී රෝහිත කුමාර මිතුරකු සමඟ නව නිවස පිටුපස දුරකථන සංවාදයක නියැලී සිටි බවට දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති බැවින් එකී පහරදීම සිදුවූ මොහොත සම්බන්ධ නිශ්චිත සාක්ෂියක් එකී දිවුරුම් ප්‍රකාශයෙන් හෙලිදරව් නොවේ.කෙසේ වෙතත් නවසිවායම් එදිරිව ගුණවර්ධන නඩුකරයේදී 11 වන වගන්තිය කඩවීම යන්න ස්ථාපනය කිරීමේදී වෛද්‍ය වාර්තා වැදගත් වන බව දක්වා ඇත.ඒ අනුව වින්දිතයාට සිදුකරන ලද පහරදීම් පිලිබඳ අධිකරණ වෛද්‍ය වාර්තාවේ දැක්වෙන වෛද්‍ය සාක්ෂි හා දිවුරුම් ප්‍රකාශ ඉහළ සම්භාවතාවයකින් සැසඳෙන බව නිරීක්ෂණය වන බැවින් පහරදීමක් සිදුව ඇති බව නිගමනය කල හැක.

තවදුරටත් එම්.පී.රෝහිත කුමාරගේ ප්‍රකාශයට අනුව, වින්දිත කේ.එන් රොෂාන් චන්දිම කරුණානායක රෝහල් ගත කිරිම සිදුව ඇත්තේ කේ.එන්.නුවන් චන්දිම හා එම ස්ථානයේ රැඳිසිටි නීලගම ප්‍රදේශවාසී තරුණයින්ගේ සහභාගීත්වයෙන් බවත් ඒ සඳහා කහවත්ත පොලිස් නිලධාරින්ගේ සහභාගීත්වයක් සිදුවී නොමැති බවත් පැහැදිලි වේ. තවදුරටත් එමෙන්ම කේ.එන්.රොෂාන් චන්දිම

කරුණානායකට අධිකරණ වෛද්‍ය පෝරමයක් හෝ නිකුත් කර නොමැති බව රත්නපුර පොලිස් අධිකාරී 1 තුමන් විසින් 2019.08.26 දිනැති නිකුත් කර ඇති ලිපියට අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තරකරුවන් වින්දිත රොෂාන් චන්දිමව රෝහල් ගත කිරීමට කිසිදු අයුරකින් සම්බන්ධ වී නොමැති බව නිරීක්ෂණය වේ.

2019.07.31 දින මෙම සිදුවීම සම්බන්ධයෙන් කේ.එන්.නුවන් චන්දිම ඇතුළු ගම්වාසීන් පිරිසක් රත්නපුර සහකාර පොලිස් අධිකාරී කාර්යාලයේදී ප්‍රකාශ ලබා දී ඇති බවට සඳහන් කලද 2024 වර්ෂයේ ඔක්තෝබර් මස දක්වාම මේ පිලිබඳ කිසිදු විමර්ශණයක් සිදුවී නොමැති බව වින්දිතයාගෙන් විමසීමේදී අනාවරණය විය. පැල්මඩුල්ල වත්ත (Palmadulla estate), පෞද්ගලික අංශයක් යටතේ එනම් කහවත්ත පෞද්ගලික වැවිලි සමාගම යටතේ පාලනය වන්නකි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ දීර්ඝකාලීන බදු පදනමින් මෙම රජයට අයත් තේ වතුවල කළමනාකාරීත්වය පමණක් පෞද්ගලික අංශයට පවරා දී ඇති බැවින් මෙම තේවත්තට අයත් භූමියේ හිමිකාරීත්වය රජය සතුවේ. එබැවින් මෙම නිවස ඉදිකිරීම රජයේ ඉඩමක අනවසර ඉදිකිරීමක් බව නිරීක්ෂණය වේ. ඒ සම්බන්ධව 1983 අංක 29 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ පනත) පනත වැනි නෛතික ප්‍රතිපාදන පැහැදිලිව තිබියදී මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමක් හෝ අධිකරණ නියෝගයක් ලබා ගැනිමකින් තොරව පොලිස් නිළධාරීන් විසින් ශාරීරික බලය පාවිච්චි කරමින් සිදුකරන ලද මෙම පහරදීම නීති විරෝධි බව නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථා ප්‍රකාරව "කිසිම තැනැත්තකු වද හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය." යන්න අනුල්ලංඝනීය ( Non-derogable) අයිතිවාසිකමක් වශයෙන් සහතික කොට ඇත.

එසේම <u>අමල් සුදත් සිල්වා එ කොඩිතුවක්කු</u> (SriLR 126,127) අතුකෝරාල විනිසුරුතුමා සඳහන් කරන්නට යෙදුනේ " අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාවට අනුව කිසිවකුත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට යටත් නොවිය යුතු බවට විධානය කරනු ලබයි. එමගින් සෑම පුද්ගලයකුටම වෙනකෙකු විසින් කුරිරු හෝ අමානුෂික ලෙස වධහිංසා පැමිණවීම තහනම් කෙරේ.මෙම රටෙහි සෑම පුද්ගලයකුම, ඔහු අපරාධකරුවකු වුවත් හෝ නොවූවත් මෙම අයිතිය පූර්ණ ලෙස සහතික කර ඇති ආකාරයටම හිමිකම ඇත්තේය."

ඒ අනුව මෙම කේ.එන්.රොෂාන් චන්දිම කරුණානායක නැමැති වින්දිතයා රජයට අයත් භූමියක අනවසර ඉදිකිරීමක් සම්බන්ධයෙන් වැරදිකරුවකුද නැද්ද යන්න තීරණය කිරීම අධිකරණය ඉදිරියේ පවත්නා කරුණක් විනා පොලිස් නිලධාරීන්ගේ බලතල හා කාර්යභාර්යට අයත් වන්නක් නොවේ. තවද මෙම පුද්ගලයා පවත්නා නීතිය යටතේ වරදකරුවකු වුවද උක්ත අධිකරණ තීරණයේ දක්වා ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති වදහිංසාවෙන් අත්මිදීමේ අයිතිය ඔහු කෙරෙහිද සාමාන්‍ය පුරවැසියෙක් පරිද්දෙන් සුරක්ෂිත කොට ඇත්තේය.

තවදුරටත් පොලිස් නිළධාරීන් ප්‍රකාශ කරන පරිදි පහරදීම යන්න ඔවුන්ගේ සහභාගිත්වයෙන් වියුක්ත සිදුවීමක් වුවත් තමන් ඉදිරියේ සිවිල් පුරවැසියකු සිහසුන්ව වැටී සිටි විට ඔහුව රෝහල් ගත කිරීමේ අවධානිත යුතුකමකින් (Duty of Care) නීතිය හා සාමජ පර්යාය ආරක්ෂා කරන රාජ්‍ය නිළධාරියකු වශයෙන් පොලිස් නිළධාරීන් බැඳී සිටී. ඒ අනුව පොලිස් නිළධාරීන් වශයෙන් නෛතික යුතුකම් පැහැරහැරීමක් වින්දිත කේ.එන්.ඒ.රොෂාන් චන්දිම විෂයෙහි වගඋත්තරකාර 1,2 සිදුකර ඇති බව මෙම සිදුවීම තුළ නිරීක්ෂණය වේ.

ඒ සියළු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී 1,2 වගඋත්තරකරුවන් විසින් වින්දිත කේ.එන්.ඒ.රොෂාන් වන්දිම සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

**ඒ අනුව පහත නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.**

1. ඒ අනුව 1 සහ 2 වගඋත්තරකරුවන් විසින් එක් අයකුගෙන් රු. 7500/= බැගින් රු.15000/= ක මුදලක් වින්දිත පාර්ශවය වන කේ.එන්.ඒ.රොෂාන් වන්දිම වෙත ගෙවිය යුතු බව මෙයින් නිර්දේශ කරනු ලැබේ.
2. වගඋත්තරකාර 1 හා 2 නිලධාරීන්ගේ මෙම ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා විසින් කටයුතු කල යුතුය.

2024.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තියට ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම පැමිණිලිකරු විසින්ද එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් සිම මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ( හිටපු),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල්.ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත - 1 අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

2.පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

3 අධ්‍යක්ෂ - ( අදාල නිළධාරීන් වෙත නිර්දේශය යොමු කිරිම)

පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
මානව හිමිකම් කොට්ඨාශය,
අංක : 07, 7 වන මහල, කොටා ටෙරසය,
එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ.

සැ.යු. - අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.